14 වන පිටෙන්

නූල" ලිපි එකතුව ගැන ලිවීමට පාලිත ගනේවත්ත තීරණය කර ඇත්තේ කවර අරමුණින්ද යන්න මට හිතාගත හැකි වූයේ ලිපිය කියවා හමාර කළ පසු ය. එය අප ඉස්සර කියාපු ආකාරයට "කොලේ වහලා ගැහිල්ලක්" බව මට පෙනෙයි.

මම නිදසුනකින් පටන් ගනිමි. ශ්‍රී ලංකාවේ සිටි ජනප්‍රිය ඇමති කෙනේ. සිරිල් මැතිව්. ඔහුගේ අතවැසි නිලධාරීන් දෙතුන් දෙනෙක් මා හොඳින් දැන සිටි පුද්ගලයෝ වූහ. එක් පුද්ගලයෙක් මට නිතර මුණ ගැසුනෙකි. ඔහු කියන්නට පුරුදුව සිටි එක් දෙයක් වැචගත්ය.

ඇමතිවරා තමන්ගේ ගෝලයන්ට දෙන උපදෙසක් වූයේ පිටුපසට වී තවත් කිහිප දෙනෙකු අල්ලාගෙන අත්පුඩි ගැසිය යුතු බව ය.

ඒ මොකටද?

අපේ ඇමතිතුමා කියන දේ අපේ උදවිය අගය කරන්නෙ නැතුවාට අපි සපෝර්ට් කියන කතාව සනාථ කරවනු පිණිස ය.

අනෙකා තමන්ගේ පැත්තට බර කර ගැනීමට පාලිත දරන තැත ඊට වඩා වෙනස් වන්නේ ඔහුගේ අරමුණ වෙනස් එකක් නිසා ය. තමාත් ඩී බී කුරුප්පු තරම් විවේචනයට පාත්‍ර වූවකු බව ඔහු කිසිම විටෙක නොකියයි. එහෙම කියාපු විට පාඨකයා ඉවතට හැරෙන බව සිකුරුය. සාහිත්‍ය මාසය ගැන මා ලියූ ලිපියේ සාහිත්‍ය ඝාතක සම්මානය මා වසින් පිරිනමනු ලැබූ දයාවංශ ජයකොඩි විසින් හොඳම නවකතාව වශයෙන් මුලට තෝරා ගත්තේ පාලිත ගනේවත්ත ලියූ "මාවත අබියස" යන්නය. ජගත් ජේ එදිරිසිංහ ගේ "පිනි" නවකතාවට ඒ සම්මානය පිරිනමන ලද්දේ ඉන්පසු වසරේ ය. තමා ලියූ නවකතාව පළ කිරීම සඳහා දයා-වංශට බාර දුන් නමුත් එයට සම්මානයක් ලැබෙන බවක් තමා නොසිතූ බව ජගත් 2016 සැප්තැම්බර් 25 වන දින පැවැත්වූ මගේ පොත් එළිදැක්වීමේදී කළ දේශනයේදී සඳහන් කළේය. උරණ වෙනවා නම් උරණ වීමට තවත් "පාරක්" මගේ ලිපියෙන්ම ජගත්ගේ තවත් පොතක් ගැන හෙලි කොට ඇත. ජගත් මා සිතුවාටත් වඩා පරිණත ලේඛකයකු බවට මා තීරණය කළේ මගේ පොත ලැබුණු පසු මට දුන් දුරකතන ඇමතුම ගැන කල්පනා කරන විටය.

මා බඩේ බිත්තර තියාගෙන නොලියන බව ජගත් වටහා ගෙන ඇත. ඔහුත් මා දැන සිටි (දැන් අභාවප්‍රාප්ත) මර්වින් ද සිල්වා වැනි ලේඛකයන්ට සමාන පුද්ගලයෙකි.


මා ආනන්ද විද්‍යාලයෙන් අස්වූයේ 1958 අගදීය. එවක ආනන්ද ශිෂ්‍යයකු ව සිටි දයාවංශ ජයකොඩි මා ඉගැන්වූ පරපුරට අයත් වූවෙක් කොවේ. මා ඉගැන්නුවේ සහෝදර ජේ දයානන්දටය. ඔහු පරිපාලන සේවයට බැඳී කලක් සේවය කළ බවත් දනිමි. මට දයාවංශ අවසන් වරට මුණ ගැහුණෝ මෙහි ආ විටෙකය. අප කළ කතා බහ මෙයට අදාල නැත. මට එක්තරා සැකයක් ඈතිවෙයි. මා දයාවංශ අඳුනාගත් අවදියේ පාලිත ගනේවත්ත ඉපදිලා සිටියේද යන සැකයයි.

පාලිත කරන ලොකුම වරද චිත්ත ධර්ම විග්‍රහය පටන් ගැනීම ගැනය. අද විද්‍යා-වක් බවට පත්ව ඇති චිත්ත ධර්ම ක්‍රියාවලිය විග්‍රහ කිරීමට අසීරු කාරියක් බව පාලිතට කියා දීමට මට වුවමනාවක්ද නැත. එහෙත් මගේ මතය සහ සහ මගේ හිතට වන් අදහස් - අරමුණු සහ යටිකූට්ටු වැඩ ගැන ඔහු කරන - කිරීමට අදහස් කරන - විවේචනය නිස්සාර දෙඩවීමක් බව කියමි.

අවසාන වශයෙන් පාලිතට මම රහසක් කියන්නෙමි. මෙය මෙතෙක් කිසිවකුට නොකීවේ එය පාරම්බෑමක් වන නිසා ය. මම දිනපතා උදේ සවස සුබ පතන තුන් දෙනෙක් ඇත. ඒ තුන් දෙනා මගේ මිතුරුව සිටි අය ය. දැන් මට හිතෙන හැටියට නොමිතුරුව පිටව ගොස් සිටිති. මම ඒ තුන් දෙනාටම සුබ පැතීම නොවරදවාම කරන්නෙමි.

මගේ මනසට යොමු කරන ලද ඔබේ රැස් දහරට මේ ටික හසු නොවනු ඇත.

ඩී බී කුරුප්පු




35 වන පිටෙන්




තත්ත්වයද එයට සමාන විය. ඒ වන තෙක් මරණයත් ජීවිතයත් අතර දෝලනය වෙමින් සිටි සෙන්පති කිරාන් මුලතිව් වෙරළට පැමිණ අවසන් හුස්ම හෙළුවේය.

ඉතාමත් දරුණු තත්ත්වයක සිටි අයට ප්‍රතිකාර කිරීම සඳහා ස්ථානයක් සූදානම් කර තිබුණි. දැඩි වෛද්‍ය සත්කාර යටතේ පසුවූ ඔවුන් සම්පූර්ණයෙන්ම සුවවීමට මාසයකටත් වඩා වැඩි කාලයක් ගතවිය. එහෙත් ඔවුන් ආරෝග්‍ය සම්පන්න අය බවට පත්වීමට තවත් මාස ගණනාවක් ගතවිය.

ඔවුන්ට කොලරා රෝගය ඇතිවීමට හේතුව පිළිබඳව සොයන්නට පටන්ගන්නේ ඔවුන් සුවවීමට පටන් ගත් පසුවයි. මෙම බළඇණිය ගමන් කරමින් සිටි මාර්ගයේ දිගින් දිගටම හමුදාව සමඟ ගැටෙන්නට සිදුවිය. එයින් දින ගණනාවක්ම ආර-ක්ෂිත ස්ථානවල ඔවුන්ට සැඟවී සිටීමට සිදුවිය. ඔවුන් රැගෙන ගිය ආහාර ද්‍රව්‍ය ඒ අතරතුර අවසන්වී ඇත. මෙයට පෙර එම මාර්ගයේ ගමන් කළ සටන්කාමීන් විසින් ගස් උඩ සඟවා තබා යන ලද වේළූ මීහරක් මස් උයන්නේ නැතිව කෑමට සිදුවූ බවටත් ඔවුන්ට බීමට ලැබුණේ යන මග රැඳී තිබුණු ජලය බවටත් ඔවුහු ප්‍රකාශ කළහ. එයට පසුව තමන්ට දිගමට බඩ යාම සහ වමනය ඇතිවූ බවත්, ජීවිතය බේරාගත් සටන්කාමියෝ තම අත්දැකීම් බෙදාගැනීමේදී ප්‍රකාශ කළෝය. තම සාමාජිකයන් එකා දෙන්නා බැගින් මිය යමින් සිටිද්දී ඔවුන්ගෙන් සමහරෙකු පමණක් වළ ලෑමට හැකිවූ බවත් සියලු දෙනාම රෝගයට ගොදුරුවී දුර්වල වූ පසුව මිය ගිය අයගේ සිරුරු එලෙසින්ම කැළෑවේ දමා පැමිණි බවත් ඔවුහු ප්‍රකාශ කළහ. මෙම අත්දැකීම් සවන් වැකුණු සියලු සටන්කාමීන්ට එය මහත් බියකරු අත්දැකීමක් විය.

එයට මාස ගණනකට පසුව වන්නියෙහි ජනතාව අතර කොලරා රෝගය පැතිරෙන්නට විය. තැනින් තැන එක්කෙනෙකුට දෙන්නෙකුට එම රෝග ලක්ෂණ පහළ වීමට පටන්ගත්විටම වෛද්‍යවරු වහා උත්සුක වූහ. ජනතාව ඒ වන විටත් දරුණු යුද්ධයකින් මෙන්ම මන්දපෝෂණය සහ දුප්පත්කමින් පීඩා විඳිමින් සිටිද්දී කොලරාව නම් භයානක මාරාන්තික වසංගතයක් පැතිරෙන්නට පටන්ගතහොත් ඇතිවිය හැකි මහත් වූ විපත සිතා ගැනීමට බැරි තරම් විය. නායකතුමාගේ උපදෙස් මත දේශපාලන අංශයත්, වෛද්‍ය අංශයත් එකට එක්ව දැඩි ලෙසින් කටයුතු කිරීමට පටන් ගත්තේය. රෝගය පිළිබඳව දැනුම්වත් කිරීමේ වැඩසටහන සහ රෝගයට පත්ව සිටින්නන් සඳහා ප්‍රතිකාර ලබාදීම එකවර ක්‍රියාත්මක කළෙමු. කණ්ඩායම් වශයෙන් බෙදී සෑම ප්‍රදේශයකම දිවා රෑ නිදි නොලබා කටයුතු කළෙමු. කොලරා රෝග ලක්ෂණ සහ එහි බලපෑම පිළිබඳව පැහැදිලි කිරීම් ශබ්ද-වාහිනී යන්ත්‍ර මාර්ගයෙන් ඊළම්නාදම් පුවත්පත, කොටි හඬ ගුවන්විදුලිය ආදිය මාර්ගයෙන් ද එමෙන්ම අත් පත්‍රිකා මාර්ගයෙන් ද ජනතාව වෙත සන්නිවේදනය කළෙමු.

රෝග වැළැක්වීමේ අපේ වැඩසටහන්වලට ජනතාව මුළුමනින්ම තම සහය ලබා දුන්නේය. කොලරා රෝග ලක්ෂණ සහිත වූවන් ගම් වැසියෝ ඉදිරිපත්වී ඔවුන් සඳහා නියමිත ස්ථානවලට කැඳවාගෙන පැමිණියෝය.
මැලේරියා උණ ද වන්නියේ ජනතාව දිගින් දිගටම පීඩාවට ලක්කරන්නට විය. 'ක්ලෝරෝ කුයින්, ප්‍රිමා කුයින්, තාරා ප්‍රිම්' යනුවෙන් ඒ සඳහා වූ බෙහෙත් පෙතිවල නම ඇසූ පමණින් ඔක්කාරයට එයි. මාස හයකට පෙර මාහටත් මැලේරියා ඇතිවී මම ද මහත් ශාරීරික වේදනාවට පත්වූවෙමි. සංවිධානයේ වෛද්‍ය අංශය අඛණ්ඩවම මැලේරියා මර්දන බෙහෙත් බෙදාහැරීම කළ නිසා ටික කාලයක් තුළ වන්නියේ මැලේරියා රෝගයේ බලපෑම නැතිව ගියේය.

එක්දහස් නවසිය අනූ අට වසරෙහි අගෝස්තු මස දහතුන්වන දිනයේ දී 'සුදන්දිර පෙරවෛහල්' පුවත්පතට සටන් පෙරමුණේ ලිපියක් ලිවීමට අවශ්‍ය තොරතුරු රැස්කර ගැනීමට මම කිලිනොච්චි ප්‍රදේශයෙහි සටන් සෙන්පති 'දීපන්' හමුවීමට යමින් සිටියෙමි. සටන් පෙරමුණට ආසන්නව පිහිටි තිරුවෙ-වෙයාරු ප්‍රදේශයේ ඔහුගේ අණ දෙන මධ්‍යස්ථානය පිහිටා තිබුණි. පෙර දින රාත්‍රියෙහි ගෝණාවිල් ප්‍රදේශයේ හමුදා ගැටුමක් ඇතිවූ බව දැන සිටි නමුත්, ඒ පිළිබඳව වැඩි විස්තරයක් මම දැන නොසිටියෙමි. එම ප්‍රදේශයේ පිහිට තිබූ වෛද්‍ය මධ්‍යස්ථානයෙහි සිටි මගේ මිතුරියක් මා දුටු වහාම දුවගෙන ඇවිත් මගේ අත අල්ලා ගත්තාය. ඇය සැලකළ පුවත මගේ සිරුර පුරා පැතිතර ගියේ ගින්නක් මෙන්ය. ''තමිලිනී, අපේ සන්ධ්‍යා ඊයේ රෑ කිලිනොච්චියේ ගෝණාවිල්වල ඇතිවෙච්ච ගැටුමේ දී ඔලුව තුවාලවෙලා නැති වුණානේ...''

දිගින් දිගටම දිග් ගැස්සෙමින් පවතින කුරිරු යුද්ධයෙන් මා හෝ මගේ නැගණියව හෝ නැති නම් දෙදෙනාම හෝ මිය යනු අතැයි යන්න සහ-සුද්දෙන්ම දැන සිටි බව සත්‍යයකි. එහෙත් මා කෙ-රෙහි ඇති අපිරිමිත ස්නේහය නිසා මාව අනුගමනය කරමින් ව්‍යාපාරයට බැඳුණු මගේ නැගණිය මට පෙර සටන් පෙරමුණේදී මිය ගියාය යන්න මගේ හදවත කීතු කීතුවලට ඉරන්නාක් මෙන් විය.

මගේ නැගණිය වන නාගේෂ්වරී (ග්‍රෙගරි) සුබ්‍රමුනියම් උපන්නේ 1975 වසරේ ජූලි මස 9 වන දින දීය. ඇය ඉගෙන ගත්තේ මා ඉගෙන ගත් පාසලේමය. 1992 වසරේ දී මා සමඟ සංවිධානයට බැඳී මා සමඟ එකම පුහුණු කඳවුරේ ආයුධ පුහුණුව ලබා පසුව ''දිවි බල ඇණිය''ට අනුයුක්ත වූවාය. ඇයගේ පැහැබර සුන්දර පෙනුම දකින අය මගෙන් ''මෙයා ඔයාගේ නංගිද?'' යැයි විමසන්නේ විමතියෙන් යුතුවය. ඇය පවුලේ අනෙක් අයගේ දැඩි සෙනෙහසට ලක් තැනැත්තිය වූ අතර, දඟකාරකම් ද, එඩිතර බව ද පිරුණු තැනැත්තියක වූවාය. ඇය ඉතාමත් දර්ශනීය අකුරුවලින් කවි ලියූ අතර, චිත්‍ර ඇඳීම් ද කළාය. 1997 වසරේ මමත් ඇයත් එකම අවස්ථාවේ නිවාඩු ලබා දින තුනක කාලයට නිවසට පැමිණියෙමු. කුඩා වියෙහි සිට නිතර නිතර දබර ඇති කරගන්නා මම ඒ දිනවලද දබර කර ගත්තෙමි. ඇය මා මෙන් නිතරම පොත පත සමඟ කාලය ගත නොකර අම්මාට උපකාර වෙමින් ගෙදර දොර වැඩ කටයුතු කරන්නීය. ඥාතීන්ගේ නිවෙස්වලට යන්නීය. ''මං ඉක්මනින්ම තාත්තා ළඟට යනවා. උඹ අම්මාව බලාගනිං.'' යැයි ඇය කියන්නීය. මම සුපුරුදු ලෙසින් ගුටි දෙකක් ඇන ''පිස්සියෙක් වගේ දොඩවන්නේ නැතිව හිටපං.'' යැයි සැර කරන්නෙමි.

එවක මගේ මව සහ සහෝදරයෝ විශ්වමඩු ප්‍රදේශයෙහි ඉලංගෝපුරම් නම් ගමෙහි අපට අයිති ඉඩමක වාසය කළෝය. පවුලේ අය දුප්පත් කමින් දැඩි ලෙස පීඩා විඳිමින් වාසය කළෝය. මගේ තුවන්වන අක්කා ඒ වන විට විවාහ වී උන්නාය. මල්ලී අධ්‍යාපනය අතරමැද අතහැර දමා කඩයක වැඩ කරමින් උන්නේය. අනෙකුත් නැගණියෝ අධ්‍යාපනය ලබමින් උන්හ. අම්මා නිවෙස වටා කුඩා ගෙවත්තක් තනා තිබුණි. නැගණියගේ මරණය පවුල තුළ මහත් ශෝකයක් ඇති කිරීමට හේතු වී තිබුණි. දිග ඇදන යුද්ධයේ දී මටත් කුමක් හෝ අනතුරක් සිදුවිය හැකිය යන්න පිළිබඳව අම්මා දැඩි ලෙස බියට පත් වූවාය. නැගණියගේ අවසන් කටයුතු නිම වූ වහාම මම මගේ කඳවුරට යෑමට සූදානම් වූයෙමි. අම්මා මා වැලඳගෙන 'ඔය හිටිය ඇති දුවේ. සංවිධානයෙන් අයින්වෙලා ගෙදර වරෙන් මගේ දුවේ' යැයි කියමින් අඬා වැලපුණාය. සංවිධානය මා කෙරෙහි විශ්වාසය තබා මා වෙත වගකීම් රාශියක් පවරා තිබුණි. එමෙන්ම මාගේ ආදරණීය සටන්කාමී සහෝදර සහෝදරියෝ බො-හෝ දෙනෙකු ජීවිතක්ෂයට පත්වූහ. හිස ඔසවා අම්මාගේ මුහුණ දෙස බැලීමේ ධෛර්යය ඒ මො-හොතේ මා තුළ තිබුණේ නැත. මම නිහඬවම බිමට නැඹුරු කර ගත් හිසින් අම්මාගේ දෑත් ඉවත්කරගෙන හදවතෙහි මහත් බරක් සහිතව කඳවුරට පැමිණියෙමි.

මතු සම්බන්ධයි